**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

**බෞද්ධ ශිෂ්ටාචාරය II** **කාලය: පැය තුනයි**

උපදෙස්: පිළිතුරු පත්‍රය

- **ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි.**
- **I කොටසේ ප්‍රශ්න තුනක් ඇත. ඉන් ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතු ය.**
- **II කොටසේ ප්‍රශ්න පහකි. ඉන් ප්‍රශ්න තුනක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.**
- **ඒ අනුව දෙවන ප්‍රශ්න පත්‍රයේ ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.**

බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය සංවර්ධනය සඳහා පිළිතුරු සැපයීමේ දී නිවැරදි පිළිතුරක් නිර්මාණය කරගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ඔබට සපයන අත්වැලක් ලෙස මෙම ප්‍රශ්න හා පිළිතුරු ඉදිරිපත් කර ඇත.

## I කොටස

01) **(i) වානප්‍රස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් කෙටියෙන් දක්වන්න.** **(ලකුණු 02 යි)**

- තවුස් දම් රැකීම සඳහා වනගතවීම
- දරු මුණුපුරන් ලැබීමෙන් පසු භාර්යාව සමග හෝ හුදකලා ව වනගත විය යුතු ය.
- කාමභෝගී ජීවිතයෙන් සම්පූර්ණයෙන් ඉවත් විය යුතු ය.
- වනයෙන් සොයා ගන්නා ලද පලවැල ආහාරයට ගනිමින් හෝ පිඬුසිඟා යාමෙන් යැපිය යුතු ය.
- හෝම ගින්න නො නිවා පවත්වාගෙන යා යුතු ය.
- ආගමික අංශයට නැඹුරු ව ආත්මය මුදවා ගැනීමට ක්‍රියා කළ යුතු ය.

(ii) **මානව සංහතියේ ඒකත්වය තහවුරු කිරීමෙහි ලා බුදුසමය ඉදිරිපත් කරන ජීවවිද්‍යාත්මක සාධක පෙන්වා දෙන්න.** **(ලකුණු 03 යි)**

- වාසෙට්ඨ සූත්‍රයේ දී බුදුරජාණන්වහන්සේ ජීවවිද්‍යාත්මක කරුණු ඉදිරිපත් කරමින් මානව සංහතියේ ඒකත්වය තහවුරු කර ඇති බව
- වෘක්ෂ තෘණ ආදියෙහි ඒ ඒ ජාතියට අයත් ලක්ෂණ ඇති බව
- පක්ෂීන්, සිවුපාවුන්, උරගයන්, මත්ස්‍යයන් යන සතුන් ස්වජාතිමය ලක්ෂණ අනුව බෙදා දැක්විය හැකි බව
- මනුෂ්‍ය වර්ගයා ස්ව ජාතියට අයත් ලකෂණ අනුව වෙන් කළ නොහැකි බව
- යථා ඒතාසු ජාතීසු - ලිංගං ජාතිමයං පුථු

**(iii) පූරණ කස්සප ශාස්තෘවරයාගේ අකිරියවාදය ගෙනහැර දක්වන්න** **(ලකුණු 04 යි)**

- සියතින් කරන්නාට ද අනුන් ලවා කරවන්නාට ද අනුන්ගේ අත්පා සිඳින්නාට ද සිඳවන්නාට ද අනුන් දඬුවමින් පෙළන්නාට ද පෙළවන්නාට ද පවක් සිදු නො වන බව පූරණකස්සපගේ අකිරියවාදී දර්ශනයේ දක්වා ඇත.
- සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එක ම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් සිදුවන පාපයක් නැතැයි උගන්වන ලදී.
- ගංගා නම් ගඟේ දකුණු කෙළවර දක්වා ගමන් කරමින් හමුවන සියලු ම ප්‍රාණීන් මරමින් මරවමින් සිඳමින් සිඳවමින් ගමන් කළ ද එයින් සිදුවන පවක් නැතැයි උගන්වන ලදි.
- ඛරෝතෝ මහාරාජ කාරයතෝ ඡින්දතෝ ඡෙදාපයතෝ පචතෝ පාචයතෝ ඛුරපරියන්තේන චේපි චක්කේන යෝ ඉමිස්සා පඨවියා පාණේ ඒකමංසඛලං ඒකමංසපුඤ්ජං කරෙයො නත්ථි තතෝ නිදානං පාපං නත්ථි පාපස්ස ආගමෝ දක්ඛිණං චේපි ගංගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තෝ ඝාතෙන්තෝ ඡින්දන්තෝ ඡෙදාපෙන්තෝ පචෙන්තෝ පාචෙන්තෝ නත්ථි තතෝ නිදානං පාපං නත්ථි පාපස්ස ආගමෝ ………………”
- දන් දෙමින්, දන් දෙවමින්, යාග කරමින්, කරවමින් ගංගා නම් ගඟේ උතුරු කෙළවර තෙක් ගියේ වී නමුදු පිනක් ලෙස නිදන්ගත වන්නේ හෝ පිනක පැමිණීමෙක් සිදුවන්නේ නැති බව දානයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, සංවරයෙන්, සත්‍ය වචනයෙන් සිදුවන පිනක් නැතැයි උගන්වන බව
- උත්තරං චේපි ගංගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තෝ දාපෙන්තෝ යජන්තෝ යජාපෙන්තෝ නත්ථි තතෝ නිදානං පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමෝ දානේන දමේන සංයමේන සච්චවජ්ජේන නත්ථි පුඤ්ඤං න්තථි පුඤ්ඤස්ස ආගමෝ …..

**(iv) බුද්ධකාලීන භාරත සමාජය තුළ ප්‍රධාන ජීවන වෘත්තියක් වශයෙන් වෙළෙඳාම ක්‍රියාත්මක වූ බවට සාධක පහක් කෙටියෙන් හඳුන්වන්න.** **(ලකුණු 05 යි)**

1. ප්‍රධාන වෙළෙඳ නගර බිහිවී තිබීම

   උදා: පාටලීපුත්‍රය (මහාවග්ගපාළි)
   ශ්‍රාවස්ති, නාලන්දා, රජගහ, බාරාණස, මථුරා,සාකේත

   - ඇතැම් වෙළෙඳ නගර ඇතැම් භාණ්ඩ සඳහා ඉතා ප්‍රසිද්ධ ව තිබුණි

   උදා: කාසි ජනපදය - සුවඳ විලවුන් සඳහා
   බරණැස - රෙදිපිළි සඳහා

2. වෙළඳ මාවත් බිහිවීම

   1 සැවැත් නුවර- සාකේත, කොසඹෑ, විදිසා, උදේනි

   2 සැවැත් නුවර - රජගහනුවර, කපිලවත්ථුව

   3 කුසිනාරාව - විසාලාව, පැළලුප් නුවර

   4 බරණැස - වේරංජා තෙක්

   බරණැස් නුවර සිට - උදේනි නම් නුවරට
   පුරාබඩු ගැල් පිට ගියේ වෙළඳුන් වෙළදාමට (ගුත්තිල කාව්‍ය)

   - සමුද්‍ර මාර්ග හරහා බාහිර රටවල් සමග ගනුදෙනු කිරීම

   බුරුමය, ඉන්දුනීසියාව, චීනය, බැබිලෝනියාව, යුරෝපය
   උදා: සේද මාවත

3. වරාය භාවිත කිරීම

භාරුකච්ච, තාම්‍රලිප්ත, සුප්පාරක

- වරාය හරහා ප්‍රවාහනය කළ භාණ්ඩ
  කුලුබඩු වර්ග, සුවඳ විලවුන්, ආභරණ, සිනිඳු සළුපිළි, සීනි, සහල්, ගිතෙල්, ඇත් දත්, ලාක්ෂා
- වෙනත් රටවලින් භාරතයට රත්රන්, වීදුරු බඳුන්, පිඟන් බෙලෙක්, ඊයම් වැනි ද්‍රව්‍ය ආනයනය කර තිබීම

4. සිටුවරු පන්තියක් බිහිවීම

- වෛශ්‍ය පන්තිය පසුකාලයේ දී සිටුවරුන් බවට පත්විය.
- අනේපිඬු, මිගාර, යස, මෙණ්ඩක, සුමන, ධනංජය, බරණැස්, ඉල්ලීස, මච්ඡරිය කෝසිය, අදින්නපුබ්බක
- සිටුවර පන්තිය ද කොටස් දෙකකට බෙදී තිබුණි.
  1 මහා සෙට්ඨි
  2 චුල්ල සෙට්ඨි

5. වෙළෙඳාම් ක්‍රම කිහිපයක් බිහිවීම

- සංචාරක, ස්ථාවර, දේශීය, විදේශීය
  1 මහා පරිමාණ
  2 මධ්‍ය පරිමාණ
  3 සුලු පරිමාණ

6. වෙළෙඳ සංගම් බිහිවීම

- ඩෙකැනයේ වීර වලජජීකර් (වීර වෙළෙඳ සංගමය)
- සංගම් බිහිවීමේ අරමුණු
  1 වෙළෙඳ කටයුතු ආරක්ෂා කිරීම, පාලනය, දියුණු කිරීම
  2 තවලම් පාලනය හා සංවිධානය

7. මුදල් භාවිතය

රන්, රිදී, මසු, කහවණු

උදා:

- කුම්භඝෝෂකගේ පියා රන්කහවණු කරත්ත හතළිහකට වැඩි ප්‍රමාණයක් නිදන්කර තිබූ බවත් උදේනී රජුටවත් එවැනි ධනස්කන්ධයක් නොතිබූ බව
- අනේපිඬු සිටුතුමා ජේතවනාරාමය ඉදිකිරීමට ජේත කුමාරයාගෙන් උයන මිලදී ගත් අවස්ථාවේ දී රන් කහවණු අතුරන ලද බව
- ධනංජය සිටුතුමාගේ දියණිය වූ විශාඛාවට රන් කහවණු නවකෝටි එක් ලක්ෂයක් වටිනා මේල පලඳනාවක් තිබූ බව
- විශාඛාව රන් කහවණු දහඅට කෝටියක් වියදම් කොට පූර්වාරාමය ඉදි කළ බව

8. විවිධ කිරුම් මිනුම් ක්‍රම භාවිත කර තිබීම
   - දීඝ නිකාය අම්බට්ඨ සූත්‍රය
   - දීඝ නිකාය සාමඤ්ඤඵල සූත්‍රය

     තුලාකූට - හොර තරාදි
     කංසකූට - අගය බාල කිරීම
     මානකූට - වංචනික මැනීම
     උක්කෝටන - අල්ලස් ගැනීම
     විපරාමෝස - මං පැහැරීම
     නිකතිසාචියෝගා - රන්, රිදී නොවන දෑ එසේ යැයි කීම

9. මිථ්‍යා ආජීව දැක්වීම
   - මජ්ඣිම නිකාය මහාචත්තාරීසක සූත්‍රය
   - දීඝ නිකාය බ්‍රහ්මජාල සූත්‍රය

     කුහනා - නැති ගුණ පෙන්වීම
     ලපනා - චාටු බස් කීම
     (තමාගේ වාසියට කතා කිරීම)
     නේමිත්තිකතා - නිමිති කීම
     නිප්පේසිකතා - ස්වාර්ථ ලාභය උදෙසා අන් අයට ගැරහීම
     ලාභේන ලාභං නිජිගිංසනතා - ලාභයෙන් ලාභය ගැන කතා කිරීම

   - වෙළඳ භාණ්ඩවල මිල නියම කිරීමට හා රජගෙදර භාණ්ඩවල මිල නියම කිරීමට ගණකාමාත්‍ය නම් නිලධාරියෙක් විය.
   - මේ ආකාරයට වාණිජ ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුවත් සමග ස්වධර්ම සංකල්පය පරිහානියට පත් විය.
   - වෛශ්‍යයන් අතුරෙන් සිටුවර පන්තිය බිහි විය.
   - ඔවුහු මහජන සුභසාධනය සඳහා ද ධනය පරිත්‍යාග කළහ.
   - බමුණන්, ක්ෂත්‍රියන් අධ්‍යාපනය ලැබූ තක්ෂිලාව වැනි අධ්‍යාපන ආයතනවලට වෛශ්‍යයෝ ද ඇතුළත් වූහ.

**(v) අජිත කේසකම්බලගේ ආගමික ඉගැන්වීම් මගින් සමාජ සදාචාරයට සිදුවන අහිතකර බලපෑම පැහැදිලි කරන්න (ලකුණු 06 යි)**

දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය - දීඝ නිකාය සාමඤ්ඤඵල සූත්‍රය

- දුන් දෙයෙහි විපාක නැත.
- මහායාගයෙහි විපාක නැත.
- හෝමයෙහි විපාක නැත.
- කුසලාකුසල කර්මයන්ගේ විපාක නැත.
- පරලොව සිටිනවුන්ට මෙලොවක් නැත.
- මෙලොව සිටිනවුන්ට පරලොවක් නැත.

- මවට උපකාර අපකාර කිරීමෙන් ඵල විපාක නැත.
- පියාට උපකාර අපකාර කිරීමෙහි ඵල විපාක නැත.
- ඕපපාතිකව උපදනා සත්ත්වයන් නැත.
- මෙලොව පරලොව තමා ම දැන ලොවට හෙළි කරන මහණ බමුණන් නැත.
- සත්ත්වයා මියගිය පසු ඔහු තුළ පවත්නා සතර මහා භූතයෝ විශ්වයේ සතර මහා භූත සමග එක් වේ යැයි ද ඒ අනුව මරණයත් සමග සියල්ල අවසන් වේ යැයි ද මොහු විසින් උච්ඡේදයක් උගන්වා තිබීම.
- සතර මහා භූත හැර පුද්ගලයාගේ පැවැත්ම නොපිළිගන්නා බැවින් භෞතිකවාදියකු විම.
- මොහු කර්ම විපාක නොපිළිගන්නා බැවින් අකිරියවාදියකු වන අතර පිං පව්, මෙලොව පරලොව නොපිළිගන්නා නාස්තිකවාදියකු ද වන බැවින් මොහුගේ ඉගැන්වීම නිසා මිනිස් සමාජයේ පවත්නා සමස්ත ආචාර ධර්ම පද්ධතිය බිඳ වැටීම
- බාල පණ්ඩිත සියල්ලන් ම මරණයෙන් අවසන් වන බවත් මරණයෙන් පසු නොඉපදෙන බවත් දක්වමින් අසාස්සතවාදයක් හෙවත් උච්ඡේදවාදයක් ප්‍රකට කරන අතර ඒ හේතුවෙන් මිනිසුන් ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, සුරාව වැනි දුසිරිත්වලට යොමු වීමෙන් සමාජයේ පවතින සදාචාරාත්මක පදනම බිඳ වැටීම.
- නැවත උපතක් සිදු නොවන බැවින් ණයට ගෙන හෝ කා බී මෙලොව දී ම සැප විඳිය යුතු ය, යන සංකල්පය සමාජගත වීම තුළින් මිනිසුන් පාප මිත්‍ර ඇසුර, සුරාව, සූදුව, ස්ත්‍රී දූෂණය, මිනීමැරුම්, මංකොල්ල කෑම් වැනි අපරාධවලට යොමු වීම.
- දානයෙහි, යාගයෙහි, හෝමයෙහි විපාක නැත යනා දි ඉගැන්විම් තුළින් ආගමික සාරධර්ම බැහැර කිරීම නිසා මිනිසුන් තුළ පැවැති සාරධර්ම පිරිහී පරාර්ථකාමීත්වයෙන් තොර අයහපත් ආත්මාර්ථකාමී සමාජයක් ගොඩ නැගීම
- මෙම දර්ශනයෙහි පවත්නා සදාචාර විරෝධීබව නිසා බුදුසමය මොහුගේ ඉගැන්වීම තදින් ප්‍රතික්ෂේප කර තිබීම
  - බුදුදහම කම්මවාදී, කිරියවාදී, විරියවාදී වීම
  - කුසල් - අකුසල්, පිං - පව් පිළිගැනීම
  - දසවස්තුක මිථ්‍යාදෘෂ්ටියට පටහැනි වූ දසවස්තුක සම්මාදිට්ඨියක් ඉදිරිපත් කිරීම යනා දි කරුණු මත අජිතකේසකම්බලගේ දර්ශනය සමාජ සදාචාරාත්මක පැවැත්මට හානිදායක වන ආකාරය පැහැදිලි කළ හැකි ය.

02) (i) **බුදුරජාණන්වහන්සේ අරහං නාමයෙන් හැඳින්වීමට හේතු දෙකක් නම් කරන්න (ලකුණු 02 යි)**

- සියලු කෙලෙස්වලින් දුරු වූ බැවින්
- සංසාර චක්‍රයේ අර සිඳලු බැවින්
- කෙලෙස් සතුරන් නැසූ බැවින්
- රහසින් හෝ පව් නොකරන බැවින්
- සියලු දෙව් මිනිසුන්ගේ පූජාවන්ට සුදුසු බැවින්

(ii) **බුදුරජාණන්වහන්සේගේ ත්‍රිවිද්‍යා ඥානය නම්කොට එහි අර්ථ ලියන්න.** **(ලකුණු 03 යි)**

- පුබ්බෙනිවාසානුස්සති ඤාණය - පෙර ජාතීන්හි ස්කන්ධ පරම්පරාව සිහිකර දැනගන්නා නුවණ හෙවත් පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණයි. එනම් පෙර ආත්මභාවයන් පිළිබඳ දැන ගැනීමේ නුවණයි.
- චුතුපපාතඤාණය - සත්ත්වයන්ගේ චුතිය හා උත්පත්තිය දැනගන්නා නුවණ හෙවත් සත්ත්වයින් මැරෙන ඉපදෙන අයුරු දක්නා නුවණයි. (දිබ්බචක්ඛු ඤාණය)
- ආසවක්ඛයඤාණය - සියලු ආශ්‍රව ක්ෂය කිරීමෙන් ලබන නුවණයි. එනම්, කෙලෙස් දුරු කිරීමෙන් ලබන නුවණයි.

(iii) **බුදුරජාණන්වහන්සේ විශිෂ්ට ශාස්තෘත්වයක් ප්‍රකට කළ බවට සාධක හතරක් ගෙනහැර දක්වන්න** **(ලකුණු 04 යි)**

- දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික, සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් බුදුරජාණන් වහන්සේ ශාස්තෘවරයෙකු ලෙස හැඳින්වෙන බව
- බුදුරජාණන් වන්සේ තුන් ලෝකයට ම ගුරුවරයා වන බැවින් තිලෝගුරු ලෙස ද හඳුන්වයි.
- ශාස්තෘවරයකු ගුරුවරයකු වශයෙන් බුදුරදුන් ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ බුද්ධි මට්ටම්, මානසික ස්වභාවය, දෘෂ්ටිමය පදනම, සාමාජික පරිසරය ආදිය සැලකිල්ලට ගනිමින් විවිධ පර්යාය අනුගමනය කරමින් උපාය කෞශල්‍යයෙන් යුතු ව දහම් දේශනා කර ඇත.
- ගුරුමුෂ්ටි නොමැති ව විවිධ දේශනා ක්‍රම මගින් ශ්‍රාවකයන්ට නොසඟවා දහම් දේශනා කිරීම

ඒ සඳහා යොදාගත් ඉගැන්වීම් ක්‍රම ගණනාවක් පැවැතුණි.

- ඍජු දේශනා ක්‍රමය (දම්සක් පැවැතුම් සූත්‍රය)
- සාකච්ඡා ක්‍රමය (කන්දරක සූත්‍රය)
- උපමානුසාරී දේශනා ක්‍රමය (රාහුලෝවාද සූත්‍රය, කසීභාරද්වාජ සූත්‍රය)
- පැවරුම් ක්‍රමය (චුල්ලපන්තක හා කිසාගෝතමී වැනි අයට දේශනා කිරිම)

බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න විසඳු ක්‍රම හතරක් පෙළ දහමේ සඳහන් වේ.

- ඒකංස ව්‍යාකරණීය - ඍජු පිළිතුරු සැපයීම (ආලවක සූත්‍රය)
- විභජ්ජ ව්‍යාකරණීය - විශ්ලේෂණාත්මක ව පිළිතුරු දීම (චුල්ලකම්ම විභංග සූත්‍රය)
- පටිපුච්ඡා ව්‍යාකරණීය - ප්‍රතිප්‍රශ්න විමසා පිළිතුරු ලබා දීම (චුල්ලසච්චක සූත්‍රය)
- ඨපනීය - ප්‍රශ්න පසෙකින් තැබීම (චුල්ලමාලුංක්‍ය සූත්‍රය)
- අත්තජ්ඣාසය - තමන් වහන්සේගේ අදහසට අනුව සුදුසු ධර්මයක් දේශනා කිරීම (ධම්මචක්ක සූත්‍රය)
- පරජ්ඣාසය - ශ්‍රාවකයන්ගේ අපේක්ෂාවට අනුව දහම් දෙසීම (අරියපරියේසන සූත්‍රය)
- අට්ඨුප්පත්තික - අර්ථය පැහැදිලි කිරීම සඳහා දහම් දෙසීම (සිගාලෝවාද සූත්‍රය)
- පුච්ඡාවසික - ප්‍රශ්නයකට පිළිතුරු දීම වශයෙන් දහම් දෙසීම (මංගල සූත්‍රය)
- නිදහස් චින්තනයට හා විමංසනයට ඉඩ ලබා දීම
- යථාවාදී තථාකාරී ගුණය
- අන්‍ය ආගම් කෙරෙහි සුහඳ ආකල්පය
- පුද්ගල ස්වාමිත්වය
- තම විමුක්තිය තමාට ම පැවරීම

යන ලක්ෂණ මගින් බුදුරජාණන් වහන්සේගේ ශාස්තෘත්වය ප්‍රකට කෙරේ.

(iv) සැරියුත් තෙරුන්වහන්සේගේ චරිත ලක්ෂණ තුළින් ලැබිය හැකි ආදර්ශ හතරක් පැහැදිලි කරන්න (ලකුණු 05 යි)

1 අසීමිත ගුරු ගෞරවයකින් යුක්ත වූ බව
සැතපීමට පෙර නිවන් මග පෙන්වා දුන් අස්සජි මහ රහතන්වහන්සේ සිටින දිසාවට තෙවරක් නමස්කාර කිරීම

2 නිහතමානී බව
කුඩා සාමණේර නමක් පෙන්වා දෙන අඩුපාඩු පවා පිළිගැනීමට තරම් නිහතමානී වීම

3 ඉවසීමේ ගුණයෙන් යුක්ත වූ බව

- භාවනායෝගී ව වැඩ සිටින විට රෞද්‍ර යක්ෂයකු විසින් ටොක්කක් ඇනීම
- මහ මග වඩින විට බ්‍රාහ්මණයෙකු පිට හරහා පහරක් ගැසීම

4 අන්‍යයන්ට උපකාර කිරීම

- පිරිනිවන් පෑමට බුදුරජාණන් වහන්සේගෙන් අවසර ගෙන උපන් ගම වන නාලක ගමට වැඩම කොට, තම මෑණියන් වූ රූපසාරි බැමිණිය තෙරුවන් සරණෙහි පිහිටුවීම

(v) **හොඳ නරක වෙන්කර ගැනීමට යොදාගත හැකි නිර්ණායක පහක් පැහැදිලි කරන්න (ලකුණු 06 යි)**

1. චේතනාව හා විපාකය අනුව
   - අකුසල මුල් වන ලෝභ, ද්වේෂ, මෝහ මුල්වීමෙන් සිදු කරනු ලබන ක්‍රියා අකුසල වේ.
   - දූෂිත වූ මනසින් යමක් කරයි නම්, කියයි නම්, එහි ප්‍රතිවිපාකය ගොනා අනුව යන රෝදය සේ දුක ඔහු පසුපස ලුහුබඳී.
   - කුසල මුල් වන අලෝභ, අද්වේෂ, අමෝහ මුල් වීමෙන් සිදු කරනු ලබන ක්‍රියා කුසල වේ.
   - ප්‍රසන්න වූ සිතින් යමක් කරන්නේ ද, කියන්නේ ද, එහි සැපය පුද්ගලයා සමග යන සෙවණැල්ල සේ ගමන් කරයි.
2. ස්වකීය ව්‍යවහාර ප්‍රඥාව මත පිහිටා
   - අ.නි. කාලාම සූත්‍රයේ දී එකල භාරත සමාජයේ හොඳ-නරක වෙන් කොට හඳුනාගත් ක්‍රම 10ක් දැක්වේ.

     1. මා අනුස්සවේන - ආරංචි මාත්‍රයෙන් නො පිළිගන්න
     2. මා පරම්පරාය - පරම්පරාවෙන් පැවත එන නිසා නො පිළිගන්න
     3. මා ඉතිකිරාය - මෙය මෙසේ වී යැයි කටකතා මගින් නො පිළිගන්න
     4. මා පිටක සම්පදාය - පිටකයට ගැළපේ යැයි නො පිළිගන්න
     5. මා තක්ක හේතු - තර්කානුකූල යැයි නො පිළිගන්න
     6. මා නය හේතු - න්‍යායානුකූල යැයි නො පිළිගන්න
     7. මා ආකාරපරිවිතක්කේන - මතුපිට ස්වරූපය අනුව නො පිළිගන්න
     8. මා දිට්ඨි නිජ්ඣානක්ඛන්තියා - තම දෘෂ්ටිය අනුව සැසඳේ යැයි නොපිළිගන්න
     9. මා භබ්බරූපතා - සුදුසු බව පෙනේ යැයි කියා නොපිළිගන්න
     10. මා සමණෝ නො ගරු - අපගේ ගුරුවරයා නිසා යැයි නොපිළිගන්න

3. උභයාර්ථ සැලකිල්ලට ගැනීම

- කිසියම් පාපයක් සිදු කළ තැනැත්තා මෙලොව දී තැවෙයි ද, පරලොව දී තැවෙයි ද, දෙලොව දී ම තැවෙයි ද, තමා විසින් පවක් කරන ලද්දේ යැයි සිතා තැවෙයි ද දුගතියට ගියේ තව තවත් තැවෙයි.
- පින් කළ තැනැත්තා මෙලොවදීත් සතුටු වෙයි. පරලොවදීත් සතුටු වෙයි. දෙලොව දී ම සතුටු වෙයි. තමා විසින් පින් කරන ලදැයි සිතා සතුටු වෙයි. සුගතියට ගියේ බෙහෙවින් සතුටු වෙයි.

  (ධම්මපදය, යමක වග්ගය, 17-18 ගාථා)

4. පුද්ගල විනිශ්චය මත

- ම.නි. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී යම් ක්‍රියාවක් සිදු කරන විට ප්‍රත්‍යවේක්ෂණය කළ යුතු බව දක්වා ඇත.
- මාගේ කායික ක්‍රියාව මට දුක් පිණිස පවතී ද,
  අන් අයට දුක් පිණිස පවතී ද,
  දෙපාර්ශ්වයට ම දුක් පිණිස පවතී ද එවැනි ක්‍රියා අකුසල් වේ.
- මාගේ කායික ක්‍රියාව මට හිතසුව පිණිස පවතී ද,
  අන් අයට හිතසුව පිණිස පවතී ද,
  දෙපාර්ශ්වයට ම හිතසුව පිණිස පවතී ද එවැනි ක්‍රියා කුසල් වේ.

5. ආධිපතෙය්‍ය ධර්ම අනුව

- අත්තාධිපතෙය්‍ය - තමා ප්‍රධාන කොට ගෙන විනිශ්චය කිරීම
- ලෝකාධිපතෙය්‍ය - බාහිර ලෝකය පිළිබඳ ව සිතා විනිශ්චය කිරීම
- ධම්මාධිපතෙය්‍ය - ධර්මය ප්‍රධාන කොට ගෙන විනිශ්චය කිරීම

අ.නි. ආධිපතෙය්‍ය සූත්‍රය

6. අත්තූපනායික ධර්ම පරියායට අනුව

   සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො
   අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ

- සියලු ම සත්ත්වයින් දඬුවමට බිය වේ. මරණයට බිය වේ. තමා උපමා කොටගෙන අන් අයට හිංසා කිරීම, ඝාතනය කිරීම නො කළ යුතු ය.

03) **(i) සහස්සම්පි චේ වාචා යන ගාථාව සම්පූර්ණ කරන්න** **(ලකුණු 02 යි)**

"සහස්සම්පි චේ වාචා
අනත්ථපදසංහිතා
ඒකං අත්ථපදං සෙය්‍යෝ
යංසුත්වා උපසම්මති"

(ii) එම ගාථාවේ අර්ථය නිවැරදි ව ලියා දක්වන්න. (ලකුණු 03 යි)

අනර්ථ සිදු කරන පදවලින් යුත් වචන දාහක් වුවත් උතුම් නැත. යමක් ඇසීමෙන් මිනිසා සංසිඳීමට පත් වේ ද, එබඳු එක අර්ථවත් පදය පවා උතුම් ය.

(iii) **සුභාසිතා ච යා වාචා යන්නට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04 යි)**

- මහාමංගල සූත්‍රයෙහි සඳහන් මංගල කරුණකි.
- "සුභාසිතා ච යා වාචා" යනු යහපත් වචන කතා කිරීමයි.
- බොරු කීම, කේලාම් කීම, හිස් වචන කීම, පරුෂ වචන කීම යන වචනයෙන් වන වැරදිවලින් වැළකී යහපත් වචන කතා කිරීම.
- අංගුත්තර නිකායේ තික නිපාතයට අනුව වචන කථා කිරීම ගූථභාණී, පුප්ඵභාණී, මධුභාණී, යනුවෙන් ත්‍රිවිධ වේ. ගූථභාණී යනු දුගඳ හමන පිළිකුල් වදන් කීමයි, පුප්ඵභාණී යනු මල් මෙන් සුවඳ හමන ප්‍රිය වචන කීමයි, මධුභාණී යනු මී පැණි බඳු මිහිරි වදන් කීමයි.
- තමා විසින් කියන ලද වදන් පිළිබඳ පසු විපරම් කිරීමේ දී "ඉතා හොඳ ප්‍රිය වචන බිණුවෙමි" යැයි සතුටු විය හැකි වචනයෙන් අන්‍යයන්ට සංග්‍රහ කළ යුතු බව "ප්‍රියවාචමේව භාසෙය්‍ය යා වාචා පතිනන්දිතා" යන්නෙන් කියැවේ.
- බුදුරජාණන් වහන්සේ කෙරෙහි අමනාපයෙන් කටයුතු කළ අය ද වාද කොට පරදවමි යි වාගාඩම්බරයෙන් පැමිණි තැනැත්තන් ද අන්‍යාගමික නායකයන් ද මිසදිටුවන් ආදි බොහෝ අය ද බුදුරජාණන් වහන්සේගේ කර්ණ රසායන මිහිරි වදන් ඇසීමෙන් දමනය වූ බවට උදාහරණ ත්‍රිපිටක සාහිත්‍යයෙන් හමුවේ.

(iv) **පුද්ගලයාගේ ආර්ථික පරිහානියට හේතුවන සාධක හතරක් පෙන්වා දෙන්න. (ලකුණු 05යි)**

- සිගාලෝවාද සූත්‍රයේ භෝග විනාශ මුඛ යටතේ දක්වා ඇති කරුණු පදනම් කර කරගත යුතුයි.

  | | | |
  |---|---|---|
  | රහමෙර පානය | - | සුරාමේරය මජ්ජපමාදට්ඨානානුයෝග |
  | නොකල්හි වීථි සංචාරය | - | විකාල විසිඛා චරියානුයෝග |
  | නිතර නාට්‍ය දර්ශනය සඳහා යෑම | - | සමජ්ජාභිචරණ |
  | දූ කෙළියෙහි යෙදීම | - | ජුතප්පමාදට්ඨානානුයෝග |
  | පාප මිත්‍ර සේවනය | - | පාප මිත්තානුයෝග |
  | අලස බව | - | ආලස්සානුයෝග |

  එක් එක් භෝග විනාශ මුඛයකින් සිදුවන හානි හය බැගින් කරුණු 36 ක් දක්වා තිබේ.

- පරාභව සූත්‍රයේ සඳහන් ආර්ථික පරිහානියට අදාළ කරුණු
  - ස්ත්‍රී දූර්ත වීම
  - සුරාවට ලොල් වීම
  - සූදුවෙහි ලොල්වීම
  - නිද්‍රාශීලිබව

(v) **බුදුසමයේ දැක්වෙන චතුර්විධ සුඛය හඳුන්වා දෙන්න** **(ලකුණු 06 යි)**

1 අත්ථි සුඛ

මෙලොව කුලපුත්‍රයකු උට්ඨාන වීර්යයෙන්, බාහුබලයෙන්, දහඩිය වගුරා දැහැමි ව උපයාගත් භෝග ඇතැයි සිතීමෙන් ලබන සතුට ය.

(ඉධ ගහපති කුලපුත්තස්ස භෝගා හොන්ති උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සේදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධා. සෝ භෝගා මෙ අත්ථි උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සේදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධාති අධිගච්ඡති සුඛං, අධිගච්ඡති සෝමනස්සං. ඉදං වුච්චති ගහපති අත්ථිසුඛං)

2 භෝග සුඛ

මෙලොව කුලපුත්‍රයකු උට්ඨාන වීර්යයෙන්, බාහුබලයෙන් දහඩිය වගුරුවා, දැහැමිව උපයාගත් භෝග තම පරිභෝජනයට හා අන්‍යයන්ගේ සුභසිද්ධිය විෂයයෙහි යෙදවීම තුළින් ඇති වන පරිභෝජන සතුට ය.

(ඉධ ගහපති කුලපුත්තෝ උට්ඨානවිරියාධිගතේහි භෝගේහි බාහාබලපරිචිතේහි සේදාවක්ඛිත්තේහි ධම්මිකේහි ධම්මලද්ධේහි භෝගේ චභුඤ්ජති, පුඤ්ඤානි ච කරෝති. සෝ උට්ඨානවිරියාධිගතේහි භෝගේහි බාහාබලපරිචිතේහි සේදාවක්ඛිත්තේහි ධම්මිකේහි ධම්මලද්ධේහි භෝගේ ච භුඤ්ජාමි පුඤ්ඤානි ච කරෝමීති අධිගච්ඡති සුඛං, අධිගච්ඡති සෝමනස්සං. ඉදං වුච්චති ගහපති භෝගසුඛං)

3 අනණ සුඛ

මෙලොව කුලපුත්‍රයෙක් කිසිවෙක් හට අල්ප වූ හෝ බොහෝ වූ හෝ කිසිදු ණයක් නො දරයි. තමා කිසිවෙකුටත් ණය නැත යන සිතුවිල්ල නිසා ඇති වන සතුට ය.

(ඉධ ගහපති කුලපුත්තෝ න කස්සචි කිඤ්චි ධාරේති අප්පං වා බහුං වා. සෝ න කස්සචි කිඤ්චි ධාරේමි අප්පං වා බහුං වාති අධිගච්ඡති සුඛං, අධිගච්ඡති සෝමනස්සං. ඉදං වුච්චති ගහපති අනණසුඛං)

4 අනවජ්ජ සුඛ

මෙලොව ආර්යශ්‍රාවක තෙමේ අනවජ්ජ කායකර්මයෙන් ද, අනවජ්ජ වාක්කර්මයෙන් ද, අනවජ්ජ මනඃකර්මයෙන් ද සමන්විත වෙයි. අනවජ්ජ කායකර්මයෙන් ද, අනවජ්ජ වාක්කර්මයෙන් ද, අනවජ්ජ මනඃකර්මයෙන් ද සමන්විත යැයි ඇති වන සතුට ය.

(නිවැරදි කාය, වචී, මනෝ කර්මවලින් යුක්තවීමෙන් ඇතිවන සුඛය)

(ඉධ ගහපති අරියසාවකෝ අනවජ්ජේන කායකම්මේන සමන්නාගතෝ හෝති, අනවජ්ජේන වචීකම්මේන සමන්නාගතෝ හෝති, අනවජ්ජේන මනෝකම්මේන සමන්නාගතෝ හෝති. සෝ අනවජ්ජේනම්හි කායකම්මේන සමන්නාගතෝ, අනවජ්ජේන වචීකම්මේන සමන්නාගතෝ, අනවජ්ජේන මනෝකම්මේන සමන්නාගතෝති අධිගච්ඡති සුඛං, අධිගච්ඡති සෝමනස්සං. ඉදං වුච්චති ගහපති අනවජ්ජසුඛං)

## II කොටස

- **ප්‍රශ්න පහකි. තුනකට පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලැබෙන ලකුණු සංඛ්‍යාව 20 කි.**

04) (i) නූතන සමාජය මුහුණ දෙන ප්‍රධාන සමාජ ගැටලු අවම කර ගැනීමට පඤ්චශීල ප්‍රතිපදාවෙන් ලැබිය හැකි පිටිවහල පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

- බෞද්ධයාගේ නිත්‍ය ශීලය ලෙස සලකන පඤ්චශීල ප්‍රතිපදාව ජාති, ආගම්, කුල, භේදයකින් තොරව පුද්ගල හා සමාජ අභිවෘද්ධියට මෙන් ම සමාජ ගැටලු අවමකර ගැනීමට ඉවහල් වන ආචාර ධර්ම පද්ධතියකි.
- එහි විරති පක්ෂය සපිරීමෙන් ආධ්‍යාත්මික කුශල ශක්තිය වැඩෙන අතර චාරිත්‍ර පක්ෂය අනුගමනය කිරීමෙන් යුතුකම් ඉටු කරන සමාජයේ සියලු දෙනා කෙරෙහි බැඳුණු සාමකාමී ගැටලු විරහිත සමාජයක් බිහි වේ.
- ප්‍රාණඝාතයෙන් වැළකීමෙන් අභයදානය අගය කරන සියලු සතුන්ට දයාවන්ත වන තමාගේ මෙන් ම මෙරමාගේ ජීවත් වීමේ අයිතිය සුරකින සුහද සමාජයක් බිහි වේ.
- අදත්තාදානයෙන් වැළකීමෙන් තමාගේ දේපළ හා මෙරමාගේ දේපළ සුරක්ෂිත වන අතර වංචාව, සොරකම, අල්ලස, පොදු සම්පත් අවභාවිතය නො කරන සංවර්ධිත සමාජයක් ඇති වේ.
- කාම මිථ්‍යාචාරයෙන් වැළකීමෙන් තමාගේ මෙන් ම අනුන්ගේ පවුල් ජීවිත සුරක්ෂිත වන අතර බාලාපචාර, ස්ත්‍රී දූෂණ ගණිකාවෘත්තිය වැනි දුසිරිත්වලින් තොර, කාන්තා ගෞරවය සුරකින සමාජයක් ගොඩ නැගේ.
- මුසාවාදයෙන් වෙන් වීමෙන් සමාජය තුළ සියලු දෙනාට වංචනිකයන්ට නො රැවටී විශ්වසනීය පුද්ගලයන්ගෙන් හෙබි සමාජයක ජීවත්වීමට වාසනාව උදාවේ.
- සුරාව, මත්ද්‍රව්‍ය, මත් දුම්වැටි භාවිතය බොහෝ ගැටුම් හා සමාජ අසහනකාරී තත්ත්වයන් නිර්මාණය කරයි. ඉන් වැළකීමෙන් සමාජය තුළ මානසික සහනයෙන් හා තැන්පත් මනසකින් යුතු නීති විරෝධී ක්‍රියා නොකරන මිනිසුන්ගෙන් හෙබි සාමකාමී සමාජ වටපිටාවක් ගොඩ නැගේ.
- පඤ්චශීල ප්‍රතිපදාව උපයෝගී කර ගැනීමෙන් නූතන සමාජය මුහුණ දෙන සමාජ ගැටලු අවම කර ගැනීමට හැකිබව තහවුරු කළ හැකි ය.

(ii) **පුද්ගල ස්වාමිත්වය පිළිබඳ බුදුසමයේ ආකල්පය වෙනත් සමකාලීන ආගමික ඉගැන්වීම්වලින් වෙනස්වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)**

- පුද්ගල ස්වාමිත්වය යනු තමාට තමා හැර වෙනත් ස්වාමියකු හෝ පාලනය කරන අදෘශ්‍යමාන බලයක් හෝ නො පවතින බව ය
- බුද්ධකාලීන භාරතයේ මහාබ්‍රහ්ම, මහාපුරුෂ, පරමේශ්වර වැනි ඊශ්වර නිර්මාණ සංකල්ප හා ජගදාත්ම, පරමාත්ම, විශ්ව ආත්ම වැනි පාරභෞතික සංකල්ප ප්‍රාමාණිකත්වයෙන් ගත් මහණ බමුණන් විසූබවත්, ඔවුන් තුළින් පුද්ගල ස්වාමිත්වය ප්‍රතික්ෂේප වූ බවත් පැහැදිලි වීම
- පුබ්බේකතහේතුවාදය, අහේතුඅප්පච්චයවාදය, අකිරියවාදය - භෞතිකවාදය පිළිගත් ශාස්තෘවරු එකල සිටි බව
- ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් අනුව සර්වබලධාරී ඊශ්වරයකු විසින් සත්ත්වයා හා ලෝකයම පාලනය කරනු ලබන බව පිළිගැනීම නිසා පුද්ගල ස්වාමිත්වය අහිමි විය.

- ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකතහේතුවාදය හා නියතිවාදය ආදි ඉගැන්වීම් මගින් පුද්ගල ස්වාධීනත්වයට හානි සිදුවිය.
- බුදුදහම තුළ තමා හැර තමාව පාලනය කරනු ලබන වෙනත් බලවේග නොමැති බව දක්වා ඇත.
- තම කැමැත්තට අනුව හොඳ-නරක තමා විසින් තීරණය කොට ක්‍රියා කළ හැකි ය.
- තමා විසින් සිතාමතා කරනු ලබන හොඳ හෝ නරක ක්‍රියාවල වගකීම තමා වෙත පැවරෙන බව වටහා ගැනීම
- බුදුදහමට අනුව ලොව වසන බුද්ධිමත් සත්ත්වයා වූ මිනිසාට ස්වාධීන ව විශ්වය අවබෝධ කර ගත හැකි බව අවධාරණය කිරීම.
- සදාචාරසම්පන්න ජීවිතයක් ගත කරන මිනිසාට දෙවියන් පවා නමස්කාර කරන බව "යෙ ගහට්ඨා පුඤ්ඤකරා.........." යන ගාථාවෙන් පැහැදිලි කර ඇත.
- තමාට පිහිට තමාම ය. තමාට වෙන කිසිවකුගේ පිහිටක් නැත. එහෙයින් තමාගේ ගැලවුම්කාරයා ද තමා ම ය. (අත්තාහි අත්තනෝ නාථෝ - කො හි නාථෝ පරෝසියා)
- මිනිසා පිරිසිදු වන්නේත් කිළිටි වන්නේත් තමාගේ ම ක්‍රියාකලාපය අනුව බව බුදුදහම අවධාරණය කර තිබේ. (සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ)
- තමාම තමාට ආලෝකයක් කොට ගන්න. තමා ම සරණකොට ගන්න. බාහිර සරණක් නැත (අත්තදීපා භික්ඛවේ විහරථ - අත්තසරණා අනඤ්ඤසරණා)

05) **(i) ධර්මාශෝක රජතුමාගේ ශාසනික මෙහෙය අගය කරන්න.** (ලකුණු 10 යි)

1. ශාසන සංශෝධනයක අවශ්‍යතාව පෙන්වා දීම
2. ප්‍රධාන රටවල් නවයකට ධර්මදූතයන් වහන්සේ පිටත්කර හැරීම

   | | | |
   |---|---|---|
   | කාශ්මීර ගන්ධා | - | මජ්ඣන්තික තෙරණුවෝ |
   | මහිසමණ්ඩල | - | මහාදේව තෙරණුවෝ |
   | වනවාසී | - | රක්ඛිත තෙරණුවෝ |
   | අපරන්තක | - | යෝනකධම්මරක්ඛිත තෙරණුවෝ |
   | මහරට | - | මහාධම්මරක්ඛිත තෙරණුවෝ |
   | යෝනක දේශය | - | මහාරක්ඛිත තෙරණුවෝ |
   | හිමවත් ප්‍රදේශය | - | මජ්ඣිම තෙරණුවෝ |
   | ස්වර්ණභූමිය | - | සෝණ හා උත්තර තෙරණුවෝ |
   | තම්බපණ්ණි | - | මහින්ද තෙරණුවෝ |

3. ස්තූප ඉදිකිරීම
4. සෙල්ලිපි, පුවරුලිපි, ටැම්ලිපි, ස්තම්භලිපි ආදිය මගින් බුදුදහමේ ඉගැන්වීම් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම
   ධර්ම මහාමාත්‍යවරු පත් කිරීම
5. 13 වන ගිරි ලිපිය - ධර්ම මහාමාත්‍යවරු පිටත් කර හරිනු ලැබූ ප්‍රදේශ පිළිබඳ ව සඳහන් කර ඇත.
6. ආගමික සහනශීලිත්වයෙන් කටයුතු කිරීම
   බරාබර් ලිපිය - ආජීවකයන්ට ආරාම පූජා කළ බව
   අංක 7 ගිරිනාර් ලිපිය - සියලු ආගම් කෙරෙහිසමානාත්මතාවෙන් කටයුතු කිරීම සුදුසු බව
7. දරු දෙදෙනා සසුන්ගත කිරීම

(ii) **පැරණි භාරතයේ පැවැති බෞද්ධ විශ්වවිද්‍යාලවලින් සිදු වූ ධර්මශාස්ත්‍රීය සේවය ඇගයීමට ලක් කරන්න** **(ලකුණු 10 යි)**

**නාලන්දා විශ්වවිද්‍යාලය**

අංශ තුනකි :

1. පශ්චාත් උපාධි
2. ප්‍රථම උපාධි
   (වයස අවුරුදු 20 සම්පූර්ණ කළ ශිෂ්‍යයන්)
3. ද්විතීයික අධ්‍යාපනය

- විශ්වවිද්‍යාල ප්‍රවේශය :
  තියුණු පරීක්ෂණයකින් පසුව
  (ද්වාරපණ්ඩිත ආචාර්යවරු විසින් මෙහෙයවන ලදී).
- ඇතුළත්වීමේ සුදුසුකම් :
  සංස්කෘත භාෂාව, සංස්කෘත ධර්ම ග්‍රන්ථ හා
  බුද්ධ ධර්මය පිළිබඳ දැනීම
- ඉගැන්වීම් කළ විෂය ධාරා පහකි :
  1. භාෂා විෂය ධාරාව
  2. දර්ශන විෂය ධාරාව
  3. බුද්ධ ධර්මය විෂය ධාරාව
  4. ලෞකික විෂය ධාරාව (ආයුර්වේදය, ජ්‍යෝතිෂය, සර්ප විද්‍යාව)
  5. ලලිත කලා විෂය ධාරාව
- අනිවාර්ය විෂයයන් :
  1. සංස්කෘත භාෂාව
  2. බුද්ධ ධර්මය - මහායාන ධර්ම ග්‍රන්ථ
     - සෙසු නිකායානුගත ඉගැන්වීම්
     - අභිධර්මය
     - හේතු විද්‍යාව
- උගන්වන ලද වෙනත් විෂයයන්:
  - ජෛන දර්ශනය
  - යෝග ශාස්ත්‍ර
  - බ්‍රාහ්මණ, ආරණ්‍යක හා උපනිෂද් ග්‍රන්ථ
  - ෂඩ්විධ හින්දු දර්ශනය

  1. සාංඛ්‍ය
  2. යෝග
  3. න්‍යාය
  4. වෛශේෂික
  5. පූර්ව මීමාංසා
  6. උත්තර මීමාංසා

- ඉගැන්වීම් ක්‍රම ශිල්ප :

  දේශන, සාකච්ඡා, විවාද

- පළමු මණ්ඩලයේ කාර්යයන් :
  1. විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කිරීම
  2. පාඨමාලා පිළියෙළ කිරීම
  3. ආචාර්ය මණ්ඩලයට වැඩ බෙදාදීම

     (කීර්තිමත් ආචාර්යවරු: අසංග, වසුබන්ධු, දින්නාග, රාහුලභද්‍ර, ගුණමතී, ස්ථිරමතී, චන්ද්‍රකීර්ති, ශාන්තරක්ෂිත වැනි හිමිවරු)
  4. විභාග පැවැත්වීම
  5. පොත් පිටපත් කිරීම
  6. පොත් සම්පාදනය කිරීම
- ඉට්සිං තෙරුන්වහන්සේ වසර 10ක් නාලන්දාවේ රැඳෙමින් ගාථා ලක්ෂ පහක් ඇති සංස්කෘත පොත් 400ක් සම්පාදනය කර ඇති බව
- හියුං සියැං තෙරුන්වහන්සේ වසර 15ක් නාලන්දාවේ ආචාර්යවරයකු ලෙස සේවය කර ඇති බව
- ශීලභද්‍ර තෙරුන්වහන්සේගේ ශිෂ්‍යයකු වූ දානශීල තෙරුන්වහන්සේ ජගද්දලා විශ්වවිද්‍යාලයේ ශිල්ප හදාරා මහායාන ධර්ම ග්‍රන්ථ හැටක් පමණ ටිබෙට් භාෂාවට පරිවර්තනය කිරීම

**වික්‍රමශිලා විශ්වවිද්‍යාලය**

- අධ්‍යාපන කටයුතු :

  අධ්‍යයන කටයුතු භාර ආචාර්යවරු 108 විය.

  (දීපංකර හිමි හා ශ්‍රී ඥාන හෙවත් අතීශ හිමි ප්‍රධාන විය).
- විෂයමාලාව :

  ශ්‍රාවකයාන බුදුදහම

  මහායාන බුදුදහම

  තන්ත්‍රයාන බුදුදහම (විශේෂ විය).
- අධ්‍යයන තල දෙකකි.
  1. උපාධි
  2. පශ්චාත් උපාධි
- විෂයමාලාව : (නාලන්දා විශ්වවිද්‍යාලයට සමාන බව)
  - තන්ත්‍රයාන බුදුදහම (විශේෂ)
  - ශ්‍රාවකයාන බුදුදහම
  - මහායාන බුදුදහම
- අභිධර්මය, ව්‍යාකරණ, තන්ත්‍රයාන යන විෂයන් සඳහා වෙන ම ගොඩනැගිලි තිබුණි.

**වලභි විශ්වවිද්‍යාලය**

ඉගැන්වූ විෂයයන් :

1. සම්මිතීය නිකායික ඉගැන්වීම් (ප්‍රධාන විය).
2. බුද්ධ ධර්මය (තුලනාත්මක ලෙස)
3. හින්දු ඉගැන්වීම්
   චතුර්වේදය
   බ්‍රාහ්මණ ඉගැන්වීම්
   ආරණ්‍යක ඉගැන්වීම්
   උපනිෂද් ඉගැන්වීම්
4. ලෞකික විෂයයන්
   දේශපාලන විද්‍යාව
   ආර්ථික විද්‍යාව
   වාණිජ විද්‍යාව
   කෘෂිකර්මය

- ශ්‍රාවකයාන බුදුදහමේ කේන්ද්‍රස්ථානය වීම
- අධ්‍යාපන, පරිපාලන, පරීක්ෂණ කටයුතු පුස්තකාලය ආදිය නාලන්දාවට අනුරූප වන ලෙස ක්‍රියාත්මක කිරීම

06) (i) **ජපානයට බුදුදහම හඳුන්වාදීමේ ඓතිහාසික පසුබිම ගෙනහැර දක්වන්න.** **(ලකුණු 10 යි)**

- ජපානයට බුදුදහම ලැබීමට පෙර පැවැති ආගමික තත්ත්වය
  - ස්වාභාවධර්මයේ කල්පිත දෙවිවරුන් පිදීම
    උදාහරණ : සූර්යයා
  - ෂින්තෝ ආගම ක්‍රියාත්මක වීම
    (මළවුන් ඇදහීම මුල්කරගත් දේශීය ආගමකි)
  - කොම්පියුසියස් දහම තිබූ බව
- ජපානයට බුදුදහම හඳුන්වාදීම
  - ජපානයේ කිම්මෙයි අධිරාජයාගේ කාලයේ බුදුදහම ලැබුණු බව
    ක්‍රි.ව. 552 දී කොරියාවේ කුදාරා රාජ්‍යයේ සෙයිමේ රජතුමාගේ මැදිහත් වීමෙනි
  - දූත පිරිස රැගෙන ආ ද්‍රව්‍ය
    - බෞද්ධ පොත් රැසක්
    - ලෝහමය බුදු පිළිමයක්
    - බුදුදහම පිළිබඳ ප්‍රසංසාත්මක ලිපියක්
  - බුදුදහම ජපානයට පැමිණි කාලයේ පාලන කටයුතු වංශ තුනක සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් සිදුවූ බව
    - සෝගා වංශය
    - මොනොනොබේ වංශය
    - නකතොමි වංශය
  - සෝගාවරු බුදුදහම පිළිගත් අතර සෙසු වංශ දෙක එය ප්‍රතික්ෂේප කරන ලදි

- සෝගාවරු ප්‍රතිමා මන්දිරයක් ඉදිකොට වැඳුම් පිදුම් කරන කාලයේ වසංගතයක් ඇති වීම
- දෙවියන් උරණ වීම හේතුවෙන් වසංගතය ඇති වූ බවට විරුද්ධවාදීන් සමාජයට මතයක් ඉදිරිපත් කොට පිළිම ගෙය කඩා, පිළිමය අසල දිය අගලකට විසි කිරීම හා ධර්ම ග්‍රන්ථ ගිනිබත් කිරීම

**දෙවනවරට ජපානයට බුදුදහම පැමිණීම**

- වසංගතය දුරු වූ පසු නැවත කොරියාවෙන් භික්ෂු පිරිසක් ගෘහ නිර්මාණ ශිල්පීන් සමග බුදුදහම රැගෙන පැමිණීම හා සොගාවරු එය පිළිගැනීම
- නැවත වසංගතය ඇති වීම
- සොගාවරු ඇති කළ මතය :
  බුදුදහමට එරෙහි වීම නිසා වසංගතය වර්ධනය වූ බව
- බුදුදහමේ ව්‍යාප්තියට හේතුව :
  නැවත පිළිම වන්දනයට යොමුවීමත් සමඟ වසංගතය දුරුවීම

**ජපානයේ බුදුදහම ස්ථාපිත වීම**

- ක්‍රි.ව. 585 දී යොමෙයි අධිරාජයා බුදුසමය වැළඳ ගැනීම එරට බුදුසමයේ සංවර්ධනයට හේතු වීම
- ක්‍රි.ව. 592 දී බලයට පත් සුයිකෝ අධිරාජිනියගේ යුවරජු වූ ෂෝතෝකු තයිෂිගේ (උමයාදෝ කුමරු) කාලය බුදුදහමේ ස්වර්ණමය යුගය වූ බව
  මේ ආකාරයට ජපානයට බුදුදහම හඳුන්වාදීමේ ඓතිහාසික පසුබිම සිදුවූ බව

**(ii) ජපානයේ සංස්කෘතිය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න.** (ලකුණු 10 යි)

බුදුදහම පැමිණීමට පෙර ජපානයේ දියුණු සංස්කෘතියක් පැවති බවට සාක්ෂි හමු නොවන බව

1. **බෝධිසත්ත්ව සංකල්පය තුළින් සදාචාරවත් සමාජයක් බිහිවීම**
   මේ තුළින් ජනතාව තුළ ආචාරශීලී බව, අනතිමානිත්වය හා ධෛර්යසම්පන්න බව, කරුණාව, සුහදශීලිබව, මෘදු බව, පරිත්‍යාගශීලී බව, ඉවසීම, ආත්මදමනය ආදි උතුම් ගුණාංග සංවර්ධනය වීම

2. **බෞද්ධ විහාරස්ථාන ඉදිකිරීම හා පන්සල අධ්‍යාපන මධ්‍යස්ථානය බවට පත්වීම**
   - මුල් කාලයේ අධ්‍යාපනය රාජකීයන්ට පමණක් විවෘත ව පැවැති අතර බුදුදහම පැමිණීමෙන් පසු සාමාන්‍ය ජනතාවගේ දරුවන්ට ද අධ්‍යාපන අවස්ථා උදාවූ බව
   - අධ්‍යාපනය ලබා දීම පන්සල තුළින් සිදු කරන බව හා අධ්‍යාපන ආයතන "තෙරකෝයා" නමින් හඳුන්වන බව
   - තම ජාතිය, භාෂාව, ආගම හා සංස්කෘතිය පිළිබඳ විශේෂ උනන්දුවක් මේ තුළින් ඇතිකරන බව

3. **අවමංගල්‍ය කටයුතු කෙරෙහි බුදු දහමේ බලපෑම**

- මෘතශරීර භූමදානය කිරීම ආදාහනය කිරීමේ චාරිත්‍රය බවට පත්වීම
- ජපන් භික්ෂූන් වහන්සේ නමක් ක්‍රි.ව. 700 දී ආදාහනය කිරීමෙන් අනතුරුව මෙම චාරිත්‍රය ජපානය තුළ ආරම්භ වූ බව
- "**ඔබොන්**" උත්සවය (මළවුන් පිදීමේ අරමුණින්) විහාරස්ථානයේ දී සිදු කරන බව

4. **බෞද්ධාගමික උත්සව මගින් ජපන් සමාජ ධර්ම වර්ධනය වීම**

- හනමත්සුරි උත්සවය
  පැවැත්වූ ආකාරය
  විහාරස්ථානයේ මිදුලෙහි ඒ මොහොතේ ම නෙළාගත් මල්වලින් සකස් කරන ලද මණ්ඩපයකට (හනමිදෝ) සිද්ධාර්ථ කුමරුගේ ප්‍රතිමාව වැඩම කරවා ප්‍රතිමාව ඉදිරියේ අමාව හෙවත් පැණි රසැති තේ පුරවන ලද බඳුන් තබා රැස්වූ සියලු දෙනා සුවඳ තේ පැනින් පිළිම වහන්සේ නැහැවීම
- ජෝදෝ ඒ උත්සවය (බුද්ධත්වය සිහිකිරීම)
  දෙසැම්බර් 08
  පවත්වන ආකාරය - සෙන් ආරාමවල සාක්‍යමුනි බුදුරදුන්ගේ චිත්‍රයක් ප්‍රදර්ශනය කිරීම
  - සුජාතාවගේ කිරි ආහාර දානය සිහිපත් කරමින් සියලු බැතිමතුන්ට කැඳ වර්ගයකින් සංග්‍රහ කිරීම
- නෙහන් ඒ උත්සවය (බුදුරදුන්ගේ පරිනිර්වාණය සිහිපත් කිරීම)
  පෙබරවාරි 15
- බොන් උත්සවය (මියගිය අය සමරමින් ඔවුන්ට සංග්‍රහ කිරීම)
  මියගිය අයට ඔවුන්ගේ ආත්මවලින් මිදී මනුෂ්‍ය ලෝකයට පැමිණීම සඳහා පවත්වන උත්සවයකි.
  පවත්වන ආකාරය
  මියගිය ඥාතීන්ගේ සොහොන් කොත් පිරිසිදු කොට, පහන් දැල්වීම හා සුවඳ දුමින් පිදීම අදාළ පුද්ගලයින් ජීවත්ව සිටි කාලය තුළ ඔවුන් ප්‍රියකළ කෑම බීම, ඇඳුම් පැලඳුම් ආදිය ඔවුන්ට පරිත්‍යාග කිරීම
- තේපානෝත්සවය
  ආගම හා බැඳුන චාරිත්‍ර විධි සමුදායක් අනුගමනය කරමින් කුඩා කණ්ඩායමක් උදෙසා තේ පිළිගැන්වීම

5. **කලාශිල්ප බුදුසමය නිසා නව මුහුණුවරක් ගැනීම**

- ඉකෙබනා මල් සැකසුම් කලාව ආරම්භ වීම
  (බුදුරජාණන් වහන්සේට මල් පූජා කිරීමේ සිරිත මුල්කර ගෙන)
- නෝ, කබුකි, ඔකුම් යන නාට්‍ය කලාව බිහි වීම
- බුන්රකු නමින් රූකඩ නාට්‍ය ආරම්භ වීම
  (16 වන සියවසේ අග භාගයේ)

- සුමියේ චිත්‍ර කලාව ආරම්භ වීම
  (භාවනාව ජීවිතයේ සෞන්දර්යාත්මක කර්මස්ථාන ලෙස භාවිත කිරීම)
- හයිකු කාව්‍ය ආරම්භ වීම
  (ලෝක සාහිත්‍ය තුළ හමුවන කෙටි ම කාව්‍ය සම්ප්‍රදායකි)
- ස්වාභාවික බව ආරක්ෂාවන පරිද්දෙන් භූමි දර්ශන සැකසීම ජපන් උද්‍යාන කලාවේ මූලික තේමාව බව
- සංගීතයට බෞද්ධ අභාසය ලැබීම
  (බෞද්ධාගමික කටයුතු සඳහා සෑම විටක ම සංගීතය යොදා ගනී)
- ගෘහ නිර්මාණ සඳහා බෞද්ධ ආභාසය ලැබීම
  පන්සල් ඉදිකිරීමේ දී ඉන්දියානු හා චීන ගෘහ නිර්මාණ කලාවේ ආභාසය ලැබී ඇත
  උදාහරණ : හොර්යුජි විහාරය
  (පැරණි ම දැවමුවා ගොඩනැගිල්ල)
- මූර්ති ශිල්පය බුදුදහම ලැබීමත් සමග සංවර්ධනය වීම
  උදාහරණ :
  භේසජ්ජ ගුරු බුද්ධ ප්‍රතිමාව (හොර්යුජි විහාරය)
  තෝදඉජි විහාරයේ ඇති රෝෂණ පිළිමය
  (වෛරෝචන බුදුරදුන්ගේ පිළිමය)
  දයිබුත්සු ප්‍රතිමාව (විශාල ම ලෝකඩ බුදුපිළිමය ලෙස සලකන ලදි)

6. **සෙන් කථා කලාව ඇතිවීම**

ජපානයට බුදුදහම පැමිණීමෙන් පසු ජපන් සංස්කෘතිය බුදුසමයෙන් පෝෂණය වූ බව තහවුරු කළ හැකි බව

07) (i) **බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ දී යොදාගත් විවිධ මුද්‍රා සනිදර්ශනව හඳුන්වාදෙන්න. (ලකුණු 10 යි)**

- බුද්ධ ප්‍රතිමාවන්හි මුද්‍රා යන්නෙන් අදහස් කරන්නේ අත් සහ ඇඟිලි උපයෝගී කර ගෙන සිදු කරනු ලබන සන්නිවේදන ක්‍රියාවලියකි.
- බුද්ධ ප්‍රතිමා සම්බන්ධ මුද්‍රා රැසක් ඇතත්, මෙහි දී ප්‍රධාන මුද්‍රා හයක් පමණක් ඉදිරිපත් කරන බව

බුද්ධ ප්‍රතිමාවේ ප්‍රධාන මුද්‍රා

- සමාධි මුද්‍රාව
- අභය මුද්‍රාව
- ධර්මචක්‍ර මුද්‍රාව
- වරද මුද්‍රාව
- භූමි ස්පර්ශ මුද්‍රාව
- විතර්ක මුද්‍රාව

සමාධි මුද්‍රාව (ධ්‍යාන)

- වීරාසනයෙන් හෝ පද්මාසනයෙන් හෝ හිඳ උකුළ මත විවෘත කළ වම් අත්ල උඩ දකුණු අත්ල පිහිටුවා සංසුන් ව සිටින ඉරියව්ව බව



- හිඳි පිළිමවල බහුල ව දැකිය හැකි බව

  උදාහරණ : මහමෙවුනාවේ සමාධි පිළිමය

  තොලුවිල සමාධි පිළිමය

සංකේතවත් වන අර්ථ:

- භාවනානුයෝගී පුද්ගලයකු හිඳගෙන සිටින ඉරියව්වක් වන බව
- සිත එකඟ කර ගැනීම පිළිබිඹු කරන බව

අභය මුද්‍රාව

- දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිගහැර අත්ල ඉදිරිපසට සිටින සේ විවෘත ව තබා ඇත.



- බුද්ධ ප්‍රතිමාව තැනීමේ ආරම්භක අවස්ථාවේ සිට ම දක්නට ලැබෙන මුද්‍රාවකි.
- හිටි පිළිමවල බහුල ව දක්නට ලැබේ.

  උදාහරණ :

  අවුකන ප්‍රතිමාව, මාලිගාවිල ප්‍රතිමාව, වෙහෙරගල ප්‍රතිමාව

සංකේතවත් වන අර්ථ :

- ලෝක සතුන්ගේ බිය දුරු කිරීම

ධර්මචක්‍ර මුද්‍රාව

- දකුණු අත්ල පිටතට හරවා පපුවේ මට්ටමට තබාගෙන, එහි මහපට ඇඟිල්ල මත දබර ඇඟිල්ල කවයක් සෑදෙන සේ එකට තබා ඇතුළට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් පවතී.



- හිඳි පිළිමවලට ආවේණික මුද්‍රාවකි.


  උදාහරණ: සාරානාත් ප්‍රතිමාව - ඉන්දියාව

සංකේතවත් වන අර්ථ :

- ධර්ම දේශනා විලාසයකි.
- ධර්මය පැහැදිලි කිරීම පිළිබිඹු වේ

වරද මුද්‍රාව

දකුණු අත පහත් කොට ඉදිරියට දිග හැර අත්ල උඩු අතට හරවා ඇඟිලි දිග හැර තිබේ.



- හිටි පිළිමවල බෙහෙවින් දක්නට ලැබේ.


  උදාහරණ: ගඩලාදෙණි විහාරයේ ලෝකඩ බුද්ධ ප්‍රතිමාව

සංකේතවත් වන අර්ථ :

- පොරොන්දු ඉටු කිරීම
- පරිත්‍යාගශීලී ගුණය

භූමි ස්පර්ශ මුද්‍රාව

- දකුණු අත, දකුණු දණ හිස උඩින් අත්ල ඇතුළට සිටින ආකාරයෙන් සියලු ඇඟිලි දිග හැර පොළොව දෙසට යොමු කර සිටීම හා වම් අත, උකුළ මත අත්ල උඩට සිටින සේ තිබේ.



- මෙම ඉරියව්ව හිඳි පිළිමවලට ආවේණිකය

  උදාහරණ: - සිතුවම් කරන ලද දඹුලු ලෙන ප්‍රතිමාව

  - ඉන්දුනීසියාවේ බෝරෝබුදුර්වල ප්‍රතිමා

සංකේතවත් වන අර්ථ :

- බෝමැඩ මාර පරාජයේ දී බුදුරජාණන් වහන්සේ පාරමිතා පිරූ බවට මහ පොළොව සාක්ෂ්‍ය දැරීම

(ii) **භික්ෂු සමාජයේ පාරිශුද්ධිය පිණිස ධර්ම සංගායනාවලින් ලැබුණු පිටිවහල නිදසුන් මගින් පැහැදිලි කරන්න.** **(ලකුණු 10 යි)**

- ප්‍රථම සංගායනාව පැවැත්වීම පිණිස විවිධ හේතු සාධක බල පෑ බව පැහැදිලි කරුණකි. එහෙත් ඊට ආසන්න ම හේතුව වූයේ සුභද්‍ර භික්ෂුව විසින් කරන ලද නො භික්මුණු ලාමක ප්‍රකාශය බව ප්‍රකට ය. "අලං ආවුසො මා සොචිත්ථ මා පරිදෙවිත්ථ, සුමුත්තා මයං තෙන මහා සමණෙන. උපද්දුතා ච මයං හෝම ඉදං වො කප්පති ඉදං වො න කප්පතීති ඉදානි පන මයං යං ඉච්ඡිස්සාම තං කරිස්සාම යං න ඉච්ඡිස්සාම න තං කරිස්සාම"
- මෙම ප්‍රකාශය හුදකලා වූ භික්ෂුවකගේ ප්‍රකාශයක් ලෙස නො සැලකෙන අතර, මෙමගින් තත් කාලීන භික්ෂු සමාජයේ පැවැති බරපතල අර්බුදකාරී තත්ත්වයක් පිළිබිඹු කෙරේ.
- ධර්ම විනය එක්රැස් කර සංගායනා කොට ඒවා කොටස් වශයෙන් වර්ගීකරණය කර භාණක පරම්පරා මගින් ධර්ම විනය බුදුරදුන් දේශනා කළ අයුරින් ම පවත්වා ගෙන යාමට තීරණය කොට ක්‍රියාත්මක කිරීමෙන් අධර්මවාදී භික්ෂූන්ගේ ක්‍රියාකාරකම් යටපත් විය. ධර්මවිනයට අධර්මවාදී මති මතාන්තර එකතුවීමට ඉඩ නො තැබීමෙන් භික්ෂු සමාජයේ චිරපැවැත්ම හා පාරිශුද්ධිය තහවුරු විය.
- සංඝයා කැමැතිනම් ඛුද්දානුඛුද්දක ශික්ෂාපද සමූහනයට පරිනිබ්බාණ සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ විසින් දෙන ලද අවසරය ක්‍රියාත්මක නොකොට, පනවන ලද ශික්‍ෂාපද ඒ අයුරින් ම ආරක්ෂා කොට පවත්වා ගෙන යාමට තීරණය කිරීම මගින් භික්ෂු සමාජය තුළ පැවැති ශික්‍ෂණය හා පිරිසිදුබව ඒ අයුරින් ම පවත්වා ගැනීම භික්ෂු සමාජයේ චිරපැවැත්මට බෙහෙවින් ඉවහල් විය.
- ආනන්ද හිමියන් වෙත එල්ලවී තිබූ චෝදනා විභාග කිරීම ද භික්ෂු විනයට අදාළ ව පළමු සංගීතියේ දී සිදු වූ ඉතා වැදගත් කටයුත්තක් වූ අතර, බුදුසසුන තුළ භික්ෂුවක විසින් විනයානුකූල ව ක්‍රියා කළ යුතු ආකාරයත්, විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් අධිකරණ කටයුතු සිදුවන ආකාරයත් එමගින් අවධාරණය කරන ලද අතර, එය භික්ෂු සංස්ථාවේ චිරපැවැත්මට හා පාරිශුද්ධිය පිණිස ප්‍රථම සංගීතියෙන් සිදු වූ ඉතා වැදගත් මෙහෙයක් ලෙස සඳහන් කළ හැකි ය.
- ඡන්න හිමියන්ට බ්‍රහ්මදණ්ඩය පැනවීම ද ප්‍රථම සංගීතියේ දී සිදුවූ ඉතා වැදගත් කටයුත්තකි. ශාසනික නීතිරීති හා නියමයන්ට අනුව කටයුතු නොකොට අත්තනෝමතික ව කටයුතු කරන සාමාජිකයන්ට දඬුවම් විදීමට සිදුවන බවට කදිම ආදර්ශයක් එමගින් සැපයේ. ඒහෙයින් ඒ සිදුවීම ද භික්ෂු සමාජයේ පාරිශුද්ධිය පිණිස ප්‍රථම සංගීතියෙන් ලැබුණු මහගු පිටිවහලකි.

දෙවන සංගායනාව

- වජ්ජිපුත්තක භික්‍ෂූන් විසින් ඉදිරිපත් කොට පිළිපදින ලද දසවිධ වස්තුව එය භික්ෂු සංස්ථාවේ පාරිශුද්ධභාවය පිළිබඳ බරපතල ගැටලුවක් නිර්මාණය කිරීමට හේතු විය. රන්, රිදී ආදී මුදල් භාවිතය කැප ලෙස සැලකීම හා නො පැසුණු තෙලිදිය පානය ආදිය දස වස්තුවේ එන බරපතල කරුණු ලෙස සැලකිය හැකි ය.

- මෙම සංගීතියට සබ්බකාමී, යස, රේවත යන මහ තෙරවරුන්ගේ මූලිකත්වයෙන්, ධර්මානුධර්ම ප්‍රතිපන්න 700ක් වූ රහතන්වහන්සේලා සහභාගි වූහ.
- දසවස්තුව විනිශ්චය කිරීමට විනයානුකූල ව උබ්බාහිකාවක් පත්කොට දසවස්තුවේ එක් එක් කරුණු වෙන වෙන ම විචාරා ඒවා ධර්ම විනය විරෝධීබව තීරණය කොට නැවත ධර්ම විනය සජ්ඣායනා කොට භික්‍ෂු සංස්ථාවේ පාරිශුද්ධත්වය තහවුරු කරන ලදී.
- දසවස්තුවට අනුගත ව කටයුතු කළ වජ්ජිපුත්තක භික්ෂූන් හා ඊට සහාය පළ කළ දසදහසක් පමණ භික්‍ෂූන් අලජ්ජි, පාපී භික්ෂූන් ලෙස නම් කොට භික්‍ෂු සංස්ථාවෙන් නෙරපා හැරීම භික්‍ෂු සංස්ථාවේ පාරිශුද්ධිය වෙනුවෙන් දෙවන සංගීතියේ දී ගනු ලැබූ අතිශයින් වැදගත් තීරණයකි.
- ශාසන පාරිශුද්ධිය පිණිස දෙවන සංගීතියේ දී කාලාශෝක රජතුමාගේ අනුග්‍රහය ලබා ගැනීම ද මෙහි ලා වැදගත්වේ.
- ශාසන පාරිශුද්ධිය පිණිස දෙවන සංගීතියේ දී කාලාශෝක රජතුමාගේ අනුග්‍රහය ලබා දී ඇත.

තෙවන ධර්මසංගීතිය

- පාලි මූලාශ්‍රයවලට අනුව ධර්මාශෝක රජුගේ ලාභ සත්කාරවලට ගිජු වූ බොහෝ අන්‍යතීර්ථකයෝ ලාභ අපේක්ෂාවෙන් සසුන්ගතව දුසිල් ජීවිත ගත කළහ. ඒ හේතුවෙන් භික්ෂු සංස්ථාව බෙහෙවින් කිළිටි තත්ත්වයකට පත්ව තිබුණි. ශික්ෂාකාමී භික්ෂූහු දුසිල් මහණුන් සමග එකට පොහොය කර්ම කළ නොහැකි නිසා සත් වසරක් මුළුල්ලේ පොහොය කර්ම සිදු නොකළහ.
- ධර්මාශෝක රජුගේ අනුග්‍රහය ලබා ගත් මොග්ගලීපුත්තතිස්ස මහරහතන්වහන්සේ ප්‍රධාන වගකිව යුතු මහතෙරවරුන් තෙවන සංගායනාව පවත්වා දුසිල් මහණුන් හැටදහසක් පමණ වෙන් කොට උපැවිදි කොට නෙරපා හැර සසුන පිරිසිදු කරන ලදි.
- තවද ධර්ම විනය නැවත සජ්ඣායනා කොට ශාසනික පිරිසිදුබව හා චිරපැවැත්ම තහවුරු කරන ලද අතර, පිරිසිදු ථෙරවාදී සම්ප්‍රදාය භූගෝලීය වශයෙන් ද ව්‍යාප්ත කිරීමට රටවල් නවයකට බුදුදහම හඳුන්වා දීමට ධර්මදූත කණ්ඩායම් පිටත් කරන ලදි.

08) (i) **ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණයේ දී භාරතයේ ස්තූප කලාවේ මූලික ආකෘතිය නවීකරණය වූ ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.** **(ලකුණු 10 යි)**

සාංචි ස්තූපයේ ලක්ෂණ

- ප්‍රදක්ෂිණා පථයක් (වේදි) පැවැති අතර එයට පිවිසීමට පියගැට (සෝපාන) පේළි තුණක් ඇත.
- ගර්භය මුදුනේ හර්මිකා නමින් හැඳින්වූ ගල් ගරාදි වැටක් සහිත හතරැස් කොටුවක් විය.
- හතරැස් කොටුව මත ශිලා ඡත්‍රය දරා සිටි යෂ්ටිය (යූපය) පිහිටා ඇත.
- යූපය මත ඡත්‍රයක් විය.
- ගර්භය අර්ධගෝලාකාර ය.
- ස්තූපය වටා අලංකාර තොරණ හතරක් ඇත.

ලාංකේය ස්තූපවල ලක්ෂණ

- තුන් මහල් පේසා වළලු දක්නට ඇත.
  ඒ එක එකක් ක්‍රමානුකූල ව කුඩා වන ලෙස නිර්මාණය කර තිබේ.
- මුල්කාලීන ලාංකේය ස්තූපවල ඉහළ පේසාවේ පිට ගැටිය දිගේ නියත පරතරයක් අතර ඇත් හිස් නිමවා තිබුණි. මෙය හත්රීවේදිය නමින් හඳුන්වා ඇත. පසු කාලයේ දී එය ඉවත් කර තිබේ.
- මුල්කාලීන ලාංකේය ස්තූපවල ගර්භයට සම්බන්ධ ව ලීයෙන් කළ මුදුන් වැටක් (මුද්ධවේදිකා) තිබිණි. පසුකාලයේ දී එම නිර්මාණාංගය අභාවයට ගොස් ඇති අතර බදාමවලින් එය සංකේතවත් කර ඇත.
- මධ්‍යතන යුගයේ දී ලාංකේය ස්තූපවලට දේවතා කොටුව නමින් හැඳින් වූ නවාංගයක් එකතු විය. එය ඉදිකරන ලද්දේ හතරැස් කොටුව මත ය.
- දේවතා කොටුවෙහි සතරවරම් දේව රූප නිර්මාණය කරන ලදි.
- මුල්කාලීන ලාංකේය ස්තූපවල ද යූපය සවිකර තිබුණි. පසු කාලයේ දී එය ඉවත්කර ඒ වෙනුවට කොත්කැරැල්ල යොදන ලදි.
- මුල්කාලීන ලංකාවේ ස්තූපවල එක් ඡත්‍රයක් පැවැතිණි. පසුකාලයේ දී එය ඡත්‍රාවලියක් බවට පත්විය. අනතුරුව ඡත්‍රාවලිය වෙනුවට කොත සවිකරන ලදි.
- කොත මත චූඩා මාණික්‍යයක් විය
- ගර්භයේ හැඩය අනුව ලාංකේය ස්තූප ප්‍රධාන ආකෘති හයකට වර්ග කළ හැකි ය.

| | | |
|---|---|---|
| ඝණ්ඨාකාර | - | අනුරාධපුරයේ ථූපාරාමය, ලංකාරාමය |
| ඝටාකාර | - | කතරගම කිරිවෙහෙර, සෝමාවති ස්තූපය |
| බුබ්බුලාකාර | - | රුවන්මැලිසෑය, අභයගිරිය, ජේතවනය |
| ආමලකාකාර | - | මිහින්තලේ කණ්ඨක චෛතිය |
| පද්මාකාර | - | දෙමළ මහා සෑය හා යුදඟනා ස්තූපය |
| ධාන්‍යාකාර | - | කැලණි ස්තූපය |

(ii) **ශ්‍රී ලාංකික සමාජධර්ම බුදුසමයේ අභාසයෙන් සැකසුණු අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)**

- පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා බැඳුණු බෞද්ධ සිරිත්-විරිත්
- බුදුසමයෙන් හැඩගැසුණු සාරධර්ම
  - ශාසන මාමකත්වය
  - දන් දීම
  - ආගන්තුක සත්කාරය
  - වැඩිහිටියන්ට සැලකීම
  - පරෝපකාරය
  - අවිහිංසාව
  - ගිලානෝපස්ථානය

ශාසන මාමකත්වය

- බුදුදහම මෙරටට ලැබීමත් සමග ම එම සංස්කෘතියෙන් පෝෂණය වූ මිනිසුන් ශාසන මාමකත්වයෙන් කටයුතු කිරීම
- "මාගේ මේ ව්‍යායාමය කිසි කලෙකත් රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ය" යනුවෙන් දුටුගැමුණු රජතුමා ක්‍රියා කර ඇති බව
- ලක්දිව රජවරුන් ඇතුළු රටවැසියන් භික්ෂූන්වහන්සේලාට සිවුපසයෙන් උපස්ථාන කිරීම, ආරාම ප්‍රතිසංස්කරණය කිරීම, කඨින චීවර පූජා පැවැත්වීම, බෞද්ධ ආගමික උත්සව පැවැත්වීම ආදිය සිදු කිරීම
- තමා සතු දේ අන් අයට පරිත්‍යාග කිරීම
- ආමිස දානය, අභය දානය, ධර්ම දානය ආදි වශයෙන් සිදු කිරීම
- පූජා බුද්ධියෙන් හා අනුග්‍රහ බුද්ධියෙන් දන්දීම සිදු කිරීම
- සියලු දානයන්ට වඩා ධර්ම දානය උතුම් බව සලකා කටයුතු කිරීම

ආගන්තුක සත්කාරය

- බුදුදහමේ **අතිථිබලි** යනුවෙන් ආගන්තුකයන් සඳහා සංග්‍රහ කිරීම යුතුකමක් ලෙස උගන්වා ඇති බව
- බුදුරජාණන්වහන්සේ තමන්වහන්සේ හමුවට පැමිණෙන පිරිස් සාදරයෙන් පිළිගත් බව
- විහාරස්ථානයට වඩින ආගන්තුක භික්ෂූන්වහන්සේලා පිළිගත යුතු ආකාරය ආගන්තුක වතෙහි දැක්වෙන බව

වැඩිහිටියන්ට සැලකීම

- ශීල වෘද්ධ, ගුණ වෘද්ධ, වයෝ වෘද්ධ, තපෝ වෘද්ධ අය වැඩිහිටියන් ලෙස සැලකීම
- පිදිය යුත්තන් පිදීම මංගල කරුණක් ලෙසත්, අපචායනය දස පුණ්‍ය ක්‍රියාවක් බවත්, වැඩිහිටියන්ට සැලකීම අපරිහානීය ධර්මයක් ලෙසත් දක්වා තිබීම
- භික්ෂු සමාජය තුළ සඟ මහලු පිළිවෙළ අනුගමනය කරන බව
- තිත්තිර ජාතකය, සාලිකේදාර ජාතකය, සාම ජාතකය ආදිය මගින් වැඩිහිටියන්ට සැලකිය යුතු ආකාරය දැක්වෙන බව
- වැඩිහිටියන් යනු රටේ අභිවෘද්ධිය වෙනුවෙන් තම කාලය, ශ්‍රමය, ධනය කැප කළ සමාජය ගොඩනැගීමට දායක වූ පිරිසක් බව
- වැඩිහිටියන් දකින විට හුනස්නෙන් නැගිටීම, ඇඟිලි බැඳ කතා කිරීම, අභිවාදනය සිදු කිරීම

පරෝපකාරය

- අන්‍යයන්ට උදව් උපකාර කිරීම පරෝපකාරය බව
- බොහෝ ජනතාවගේ හා දෙවියන්ගේ හිතසුව පිණිස අර්ථය පිණිස ධර්ම චාරිකාවේ හැසිරෙන ලෙස උපදෙස් දීම
- පරත්තං පටිපජ්ජථ යන වදනට අනුගත වෙමින් කටයුතු කිරීම
- කුළාවක ජාතකයේ මඝ මානවක අයුරින් කටයුතු කිරීම

අවිහිංසාව

- සියලු සත්ත්වයන් කෙරෙහි අවිහිංසාවාදී ව කටයුතු කිරීම
- අවිහිංසාව රාජ ධර්මයක් ලෙස ගෙන කටයුතු කළ යුතු බව
- කුඩා සතෙකු වුව ද මැරීම බරපතළ වරදක් ලෙස සැලකීම
- සතුන්ට හිරිහැර කිරීම පීඩා කිරීම හිංසා කිරීම බරපතළ වරදක් ලෙස සලකමින් අවිහිංසා සහගත ව ක්‍රියා කිරීම

ගිලානෝපස්ථානය

- "යෝ භික්ඛවෙ මං උපට්ඨහෙය්‍ය සෝ ගිලානං උපට්ඨහෙය්‍ය" යන බුදුවදනට අනුව ගිලනුන්ට උපස්ථාන කිරීම
- බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කිරීම

  උදා: 
  - පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේට
  - උදරාබාධයෙන් පෙළුණු තෙරුන් වහන්සේට
  - මුගලන් මහරහතන් වහන්සේට